# රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා

# ධර්මප්‍රිය ඩයස්



"නාට්‍යකරණ රීතිවලට අනුකූල වෙමින් තම චරිතය රටම ආවේණික වූ රාමුවක් තුළ මෙහෙයවමින් කළ පරිපූර්ණ රඟපෑම නිසා මෙවර රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා ලෙස සම්මාන ලබන්නේ මෙම වැකිය ප්‍රකාශ වනවාත් සමගම දැඩි නිහැඬියාවක් ජෝන් ද සිල්වා රඟහල පුරා පැතිර ගියේ

සැමගේම හද ගැස්ම හොඳම නළුවා කවුරුන් වේද යන කුහුල සමගය. මොහොතකින් සිසාරා පැතිර ගිය උණුසුම් අත්පොලසන් හඬ මධ්‍යයේ හොඳම නළුවා වේදිකාවට අවතීර්ණ විය. ඒ ධර්මප්‍රිය ඩයස්.

**● අපි මුලින්ම ඔබේ අතීතය දෙසට ගියොත්.........**

මං මුලින්ම පාසල් ගියේ පිළියන්දල සර් ජෝන් කොතලාවල විද්‍යාලයට. අපේ ගෙවල් ළඟමයි අපේ දහම් පාසල තිබුණේ. ඒකේ මුතුහර නාට්‍ය පංති තිබුණා. පුංචිම කාලේ මගේ එකම ආශාව වුණේ ඒ අයියලා කරන දේවල් ගෙදර ඇවිත් කරන එක.

**● එතකොට ඔබ කොහොමද නාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වුණේ?**

දවසක් අපේ දහම් පාසලේ නාට්‍ය උත්සවයක් තිබුණා. මමත් ගියා මේක බලන්න. ඒකට තිබුණ නාට්‍යයක මගේ හොඳම යාළුවත් රඟපානවා. ඉතින් මටත් හිතුණා යාළුවා වගේම වේදිකාවට නැගලා නාට්‍යයක් කරන්න ඇත්නම් කියලා. මං ඒක ගිහිල්ලා එයාට කිව්වා.

කොහොම හරි මාව නාට්‍යයට ගත්තා. මට ඉස්සෙල්ලාම හම්බවුණේ සොල්දාදුවෙක්ගේ චරිතයක්. පුහුණුවීම් කරන්න පටන් ගත්ත ද ඉඳන් මම ගෙදර හිටියෙ ආමිකාරයා වගේ. ඒ තරම් නාට්‍ය පිස්සුව. ඒ හින්දමද කොහේද නාට්‍ය ඉවර වුණු ගමන් ලොකු හාමුදුරුවෝ මගේ ඔළුව අතගාලා කිව්වා කොලුවා වැඩේ හොඳට කළා කියලා. මං හිතන විදියට ඒ ආශිර්වාදය මේ ගමන එන්න මට ලොකු ශක්තියක් වුණා.

ඔන්න දැන් සා. පෙළත් ඉවරයි. උසස් පෙළ කරන්නත් කිසිම ආශාවක් නෑ. ඒ කාලේම මට ආරංචි වුණා පිළියන්දල සෙන්ට්‍රල් එකේ සර් කෙනෙක් ළමයින්ව දලා නාට්‍ය කණ්ඩායමක් හදන්න යනවා කියලා. මමත් අපේ මාමා සෙනරත් දීපාල් ගමගේ එක්ක ගියා සෙන්ට්‍රල් එකට. ඒත් නාට්‍ය කරන්න විතරක් ඉස්කෝලේ යන්න බැනේ. අපි දැම්මා ඇප්ලිකේෂන් එකට උසස් පෙළ සඳහායි කියලා. ඒත් බෑ. සුදුසුකම් ඕන කොහොම හරි මාමා මගේ ඇවිටිල්ලට මාව ඉස්කෝලෙට ඇතුල් කළා. ඊට පස්සේ ප්‍රේමකුමාර කරුණාරත්න සර්ගේ පිහිටෙන් මේ ගමන දිගටම ආවා.

**● ඔබ රඟපෑ නාට්‍ය ගැන කියනව නම්?**

කේ. බී. හේරත්ගේ දෙවන මහින්ද, වාසුදේව ජයලත් මනෝරත්නගේ ගුරුතරුව, කනේරු මල්, නීල් අලස්ගේ සිහින සාප්පුව, තව හුඟාක් නාට්‍යවල රඟපෑවා.

**ඔබ මෙවර හොඳම නළුවා විදියට සම්මාන ලැබුවා. මොන වගේ හැඟීමක්ද ඒ වෙලාවේ දැනුණේ.**

මම සම්මාන බලාගෙන නාට්‍ය කළේ නෑ. මගේ එකම බලාපොරොත්තුව වුණේ අපේ නාට්‍ය පුළුවන් තරම් හොඳට කිරීම. කොටින්ම මගේ නම කියනවා පවා මට ඇහුන්නෑ. මට දැනුණේ නොදැනිම මාව ස්ටේජ් එකට යනවා වගේ. හැම පැත්තෙන්ම ඇහෙන අත්පුඩි හඬ, යහළුවන්ගේ සුබපැතුම්...... ඇත්තටම ඒ මොහොතේ මගේ ඇස් දෙකට කඳුළු ආවා. මේ වගේ රත්තරං යහළුවන් ටිකක්නේ මට ඉන්නේ කියලා හිතුණා.

**● ඔබට මෙම සම්මානය හිමි වුණේ හයිනා කියන වේදිකා නාට්‍ය වෙනුවෙන්. මේ නාට්‍ය මෙතරම් සාර්ථකව ඔබට රඟපාන්නට හැකි වුණේ කොහොමද?**

මෙයට මූලික හේතුව වුණේ හයිනා අධ්‍යක්ෂක චාමික හත්ලහවත්ත. ඔහුගේ තිබුණු නිවැරදි මගපෙන්වීම හා තම නිර්මාණය පිළිබඳ ඇති පැහැදිලි අවබෝධය මේ සම්මානයට මට බොහෝ සෙයින් උපකාර වුණා. එසේම මාත් මේ නාට්‍යයට අනුකූල රාමුව පිළිබඳ අවබෝධයක් ලබාගත්තා.

**● මෙවර රාජ්‍ය නාට්‍ය උළෙලේදී ඔබ හයිනා, සූකරයෙක් සමග, නම්බුකාර විලාසිනී කියන මේ නාට්‍ය තුනටම දයක වුණා. සියල්ලම සංකීර්ණ චරිත. මෙය නිවැරදිව කළේ කොහොමද?**

පටලවා නොගෙන පියවරාන්විතව කිරීම තමයි මෙයට මුල් වුණේ. පුහුණුවීම්වලදී පවා මේ පරතර සහිතවයි කළේ. ඒත් අවසාන වටයේදී නාට්‍ය තුනම අවසාන වටයට තේරුණු නිසා ඒක මට ප්‍රබල අභියෝගයක් වුණා. ඒත් සරත්, චාමික හා රුවිනිගෙන් ලැබුණු උපරිම සහයෝගය නිසා ඒවා සියල්ල ඉතා සාර්ථකව කරන්න මට හැකියාව ලැබුණා.

**● මෙවර නාට්‍ය උළෙලේදී ඔබ මේ සම්මානය ලැබුවේ සරත් කොතලාවල වැනි සම්මානනීය නළුවෙක් සමග කරට කර තරග කිරීමෙන්. මෙයින් ඔබ ජයගත්තේ කුමක් නිසාද?**

මං කරන්නේ එකම එක දෙයයි. වේදිකාවේ රඟන පුංචිම චරිතය දිහා පවා හොඳට බලන් ඉන්න එක. ඒ හැම දෙයකින්ම අපිට අරගන්න පුළුවන් දෙයක් තියෙනවා. සරත් සතු හැකියාවත් මාගේ නිර්මාණයට යොදාගෙන. මගේ හැකියාවත් වැඩිදියුණු කර ඉදිරියට යාම තමයි මා හිතන විදියට ඊට හේතුව.

**● මීට පෙර ඔබ වෙනත් සම්මානයන්ට පාත්‍ර වෙලා තියෙනවාද?**

අරුන්දතී (තුම්දු දෙඩන්තැන්න) නාට්‍ය සඳහා හොඳම සහාය නළුවා සම්මානය ලැබුණා. අයිනමාලි නාට්‍යයට රංගන කුසලතා සම්මානය ලැබුණා. රාජිතගේ වීරයා මැරිලා, සරත්ගේ සූකරයෙක් සමග යන ඒවාට සහාය නළුවාට නිර්දේශ වුණා.

**● අද තරුණ පරපුරට රාජ්‍ය නාට්‍ය මණ්ඩලයෙන් හා සංස්කෘතික අමාත්‍යාංශයෙන් පැහැදිලි සේවයක්**

(23 වැනි පිටුවට....)

සටහන
මුතුමුදලිගේ නිශ්ශංක